*9 වන පිටුවෙන් (ගමේ චණ්ඩි ස්ටැන්ලිද)*

වලදී වන්දනාකරුවන් ට පන්ති පරතරය, මුදල් සහ දමරික හිත මිතු කම් බල පාන ආකාරයයි. මේ පදමාලාවේ අප වඩාත් ප්‍රිය කළ කොටස නම් ඩිංගිරි අම්මා, ඇයට නුවර දී හමුවූ ගමේ චණ්ඩියෙකු වන "ඉස්ටැන්ලි" නමැත්තා පිළිබඳ කරන සඳහනයි. ඒ වෙනත් කිසි හේතුවක් නිසා නොව අපේ කණ්ඩායමේ නුවර ප්‍රදේශයෙන් පැමිණි එක් සිසුවෙකු ගේ නම ස්ටැන්ලි වීම යි. මනා දේශපාලන පරිචයක් සහ නිවැරදි දැක්මක් තිබූ ඔහු මගේ හොඳ මිතුරෙක් විය. සුනිල් ආරියරත්න නුවර චණ්ඩියන් ගැන මනා දැනුමක් ඇත්තෙක් බව කියමන් අපි ඔහුට සරදම් කළෙමු.

ඒ සරදම් කෙසේ වෙතත්, ඒ වන විට කවි කිහිපයක් ලියා යොවුන් ජනතා පත්‍රයේ ද, අපේ කලා කවයේ බිත්ති පුවත් පතේ ද පල කර තිබුනු මා තුල සුනිල් ආරියරත්න සිය මේ ගීතය නිබන්ධනය කිරීමේ දී ඉස්ටැන්ලි යන සුවිශේෂී නාමය චණ්ඩියෙක් හැඳින්වීමට යොදා ගත්තේ ඇත්තට ම කවර හේතුවක් නිසාද කියා දැන ගැනීමට මා තුල යම් කිසි කුතුහලයක් ඇතිවිය. මෙම ගීතයේ එන අනෙක් පුද්ගල නාමයන්, එනම් "ඩිංගිරි අම්මා" සහ "ගජමන් නෝනා", යොදා ඇත්තේ මන්දැයි ඉතා පැහැදිලිය.

"ඩිංගිරි අම්මා" යන්නෙන් සුනිල් ආරියරත්න අදහස් කරන්නට ඇත්තේ ගමේ ගොඩේ තලතුනා උපාසිකාවක් නියෝජනය කිරීමයි. "ගජමන් නෝනා" යනු මාතර යුගයේ සිටි සුප්‍රසිද්ධ කිවිඳියෙකි. ඩිංගිරි අම්මා කවි ලියන්නියක් නිසා පානම් පත්තුවේ ගම් වාසීන් ඇයට ගජමන් නෝනා යැයි නම් පට බැඳීම සිතා ගත හැකි කරුණකි. එහෙත් "ඉස්ටැන්ලි" යනුවෙන් අප දන්නා කියන චණ්ඩියෙක් ඉතිහාසයේ සඳහන් නොවෙයි. මෙයාකාරයෙන් බලන කල කුතුහලය ඉතා දැඩිවේ.

මේ සියළු ගැටළු නිරාකරණය කර ගැනීමට කදිම අවස්ථාවක් ටික දිනකින් ම උදාවිය. නන්ද මාලිනිය ගේ ගී පිළිබඳ සම්මන්ත්‍රණයක් මහනුවර කටුකැලේ හින්දු සංස්කෘතික මධ්‍යස්ථානයේ දී පැවැත්වෙන බවට ප්‍රචාරය කෙරුණි. පුදුමයකට මෙන් මේ සම්මන්ත්‍රණය සංවිධානය කර තිබුනේ, ඊට වසර හතරකට පෙර "නන්ද-සුනිල්" ගී ප්‍රතිගාමී ගී බවට නිර්දය ලෙස විවේචනය කළ සුචරිත ගම්ලත් ගේ නායකත්වය යටතේ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය විසිනි. මෙම සම්මන්ත්‍රණය සඳහා නන්ද මාලිනිය ද, සුනිල් ආරියරත්න ද සහභාගී වන බව ද සඳහන් විය.

ගමේ චන්ඩියා ගේ නම පිළිබඳව මගේ කුතුහලය විසඳාගන්නට මෙය කදිම අවස්ථාවක් බව සිතූ මම ස්ටැන්ලි ඇතුළු මිතුරන් කිහිප දෙනෙකු සමග නියමිත දින එහි ගියෙමු.

ඒ සම්මන්ත්‍රණය පිළිබඳ විස්තර මීලඟ කලාපයෙන් බලාපොරොත්තු වන්න.

එතෙක් සුනිල් ආරියරත්න විසින් පබැඳි, නන්ද මාලිනිය ගැයූ ප්‍රස්තුත ගීතය මෙන්න.

පානම් පත්තුවේ ඩිංගිරි අම්මාය
ගමේ අයට නම් ගජමන් නෝනාය
කවි කර කියන්නේ දැහෙන් දුටු දේය
වට වන්දනාවෙදි නඩයම දුටු දේය

වඳිනට ගිය කලට නුවරට දළදාව
ගමේ චණ්ඩි ඉස්ටැන්ලි ද සිටියා ය
යාළු නිළමෙලා දොර හැර දුන්නා ය
ළඟටම ගිහින් ඔහු දළදා වැන්දා ය

හම්බන්තොටින් පසුකර ලුනු ලේවාය
කතරගමට අපි යහතින් ආවාය
සිටියදි පෝලිමේ අපි ගෙන පූජාව
සීයේ කොල වලට මුල් තැන ලැබුනාය

සිරිමා බෝධියට ගිය ද උදයේ ම
කාර් ගොඩක් ආවා එක එක පාට
තෙරපී සිටියදී අපි පඩිපෙල ගාව
ඒ මහතුඟ රන් වැට පැන වැන්දය



## නිරුවත් සිතිවිලි...

ඊයේ පෙරේදා දවසක දුරකතන ඇමතුමක් ලැබුණා. මගේ සොහොයුරියක ගෙන්. ඇය මගෙන් ඇහුවා අපේ කඳුළු නතර වෙන්නෙ කවද්ද කියලා. මට දෙන්න තිබුණේ එකම උත්තරයයි. ගංගාවල් ගලාගෙන යනවා හිඳෙන්නේ නැහැ. අපේ කඳුළුත් ඒ වගේ. අපි ඉන්නේ සෞම්‍ය භූමියක. ඉතින් ගහකොල තියෙනකම් පොලොවේ තෙත රැඳෙනවා. දිය උනනවා. අපේ ජීවිතත් ඒ වගේ තමයි. අපි අපේ හැඟීම් අපේ ජීවිත බෙදා ගන්න තාක්කල් අපේ කඳුළු නතර වෙන්නෙ නැහැ. මොකද සතුටටයි, දුකටයි දෙකටම අපි කඳුළු බෙදා ගන්න හින්දා කියල

ඔබ මොකද හිතන්නේ? ඔබ මාත් එක්ක එකඟ නොවෙන්න පුළුවන්. කඳුළු කියන්නෙ කොච්චරවත් වේදනාවක්. කඳුළුත් එක්ක ජීවත් වෙනවා කියන්නෙ මොන මූසලකමක්ද? ඔබට එහෙම හිතේවි ඒ වුණත් කඳුළ කියන්නෙ හොඳ යාළුවෙක්. කාත්කවුරුවත් නැති වෙලාවකත් ඇතිවෙලාවකත් ජීවිතේ තනියෙන් හුදකලාව දරාගන්න වෙලාවකත් අපිව දරා ගන්නේ කඳුළු බිංදුවලට පුළුවන්. ඉතින් අපි කොහොමද කඳුළු හෑල්ලු කරන්නේ.

ජීවිතය විඳගන්න බැරි අසීරුතම බර මහමෙරක් නම් ඒ මහමෙර දියකරන්න පුළුවන් කඳුළුවලට විතරයි. සමහරක් වෙලාවට ඒ කඳුළු හෙලන්නත් අපි හැංගෙන්න ඕන. නානකාමරයකදී, ළිඳක් ළඟකදී එහෙමත් නැත්නම් කාටත් නොපෙන අඳුරේදී තමයි අපි මහමෙර දිය කරලා හරින්නේ. කොපුල් තෙමා ගෙන ගලා යන වතුර බිංදුවල හංගලා අපි ඒ බර නිදහස් කරනවා.

මට කඳුළු ගැන මෙහෙම කියන්න හිතුනේ ඇයි? එළියට එන්න පාරක් නැතිව බරට ඒත් නොවැටී තියෙන කඳුළු බිංදුවක් ඇහැමූල බරට දනුන හින්දා. මට හිතෙනවා මගේ කඳුළේ බර ඇයි අනිත් අයට දෙන්නේ කියලා. ඒ වුණත් ඒ කඳුළු තියෙන්නේ බෙදා ගන්න. මගේ කඳුළු  වැටන්නේ කලින් ඒ කඳුළ බෙදා ගන්න ඉන්න අයට මාව දැනෙනවා. මට මාව හංගගන්න බෑ.

ජීවිතේ දරාගන්න බැරි බර කරතියාගෙන යන්න එපා. මොකද මහමෙර වුණත් දිය කරන්න ඒ බර අපිත් එක්කම දරා ගන්න කඳුළු අපේ ඇහැමූල තියෙන හින්දා... සම්පතමයින්ගේ ඇහැමූල තියෙන හින්දා...

අපි ජීවිතය බෙදා ගන්නවා නම් සතුටයි දෙකම බෙදා ගන්න ඕන. හැබැයි ඒ සතුටු කඳුළු වගේම දුක් කඳුළු වලටත් වටිනාකමක් දෙන වටිනාකමක් තියෙන අයත් එක්ක. ඔබත් ඔබේ කඳුළු බෙදා ගන්නවද? මහමෙර දියකර හරිනවද? උත්සාහ කර බලන්න ඔබට දැනේවි අප්‍රමාණ සැහැල්ලුවක්. හුළගේ පාවෙන කුරුළු පිහාටුවක් වගේ.

මම ලිහිණි.


**ESRS** **Mathematics and Physics Tutoring**

**Quality tutoring for primary, secondary and VCE students conducted by university experienced teachers!**
Our classes focus on each student's individual needs and learning style. We provide quality learning materials to students.

**ESRS Rates:** Primary $20/hour and Secondary-VCE $30/hour

For further details visit ESRS website at:
http://esrs.vic.googlepages.com/

**Contacts:**
Dr. Chandra Athaudage [PhD(RMIT), MSc(Japan), BScEng(Hons)]]
Mrs. Priyantha Nandasena [MEngSc(Monash), MSc, BScEng(Hons)]
**Tel:** (03) 9795-5070 **Mobile:** 0422001605
**Email:** c.athaudage@gmail.com or pri.nandasena@gmail.com

**ශ්‍රී ලාංකික ඔබේ රියදුරු පාසල**



**Ravin** රවින්
*Professional / Patient Instructor*
*Easy Learning Techniques*
*Exceptional Pass Rate*

**Iyoka**
**Driving School**
Training Excellence

Tel : 94021196
Mobile : 0433028029
iyoka_ds@yahoo.com.au